# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

| භූගෝල විද්‍යාව | 07 ශ්‍රේණිය | කාලය පැය. 02 යි |
|---|---|---|

නම: ..............................................................

## I කොටස

- **දී ඇති උපදෙස් පිළිපදිමින් පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න**

❖ **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පෘථිවියේ සමක පරිධිය වන්නේ,
   - i. 12757km
   - ii. 40077km
   - iii. 12714km
   - iv. 39943km

2) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වන්නේ වර්ග කිලෝමීටර මිලියන,
   - i. 510 කි.
   - ii. 65610 කි.
   - iii. 12757 කි.
   - iv. 550 කි.

3) ''සහරා'' කාන්තාරය පිහිටා ඇත්තේ මින් කුමන මහද්වීපයේද?
   - i. ආසියා
   - ii. අප්‍රිකා
   - iii. දකුණු ඇමරිකා
   - iv. ඇන්ටාක්ටිකා

4) ශ්‍රී ලංකාව පිහිටා ඇති අක්ෂාංශ හා දේශාංශ වන්නේ,
   - i. උ:අ: 5.55.-9.51 ත් නැ:දේ: 79.42-81.53 ත් අතරය.
   - ii. උ:අ: 5.55-9.51 ත් නැ:දේ: 79:42-81.55 ත් අතරය.
   - iii. උ:අ: 5.54-9.51 ත් නැ:දේ: 79:42-81.52 ත් අතරය.
   - iv. උ:අ: 5.55-9.52 ත් නැ:දේ: 79:42-81.54 ත් අතරය.

5) පැසිෆික් සාගරයේ පිහිටි මුහුදක් නොවන්නේ,
   - i. ජපන් මුහුද
   - ii. චීන මුහුද
   - iii. ඔකොට්ත්ස් මුහුද
   - iv. උතුරු මුහුද

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

6) ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා දිග ...................... කි.
   (කි.මී. 432, කි.මී. 224, කි.මී. 510)

7) උස මීටර 300 ට වඩා වැඩි ....................................... යි.
   (මධ්‍ය කඳුකරය, වෙරළබඩ තැනිතලාව, අභ්‍යන්තර තැනිතලාව)

8) ශ්‍රී ලංකාවේ වසරේ මැයි, ජුනි, ජුලි යන මාසවල සක්‍රිය වන වර්ෂාව වන්නේ ...............................ය.
(නිරිත දිග මෝසම් වර්ෂාව, ඊසාන දිග මෝසම් වර්ෂාව, වාසුලි වර්ෂාව)

9) සමාජ සංවර්ධන දත්ත (2012) ට අනුව අයු අපේක්ෂාව අවු 75.1 ක අගයක් සහිත, දකුණු ආසියාතික රට වන්නේ ............................ යි.
(මාලදිවයින, භූතානය, ශ්‍රී ලංකාව)

10) ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව වැඩි දියුණු වීමට බලපා ඇති සාධකයකි ...........................................................
(යහපත් ආකල්ප ඇති වීම, ආයු අපේක්ෂාව වැඩි වීම, නොමිලේ අධ්‍යාපනය ලබාදීම)

- **අංක 11 සිට 15 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

11) ශ්‍රී ලංකාවේ අගනුවර වූ කොළඹ නගරය තෙත් කලාපයේ පිහිටා ඇත. ( )

12) නකල්ස් කඳු වැටියට දකුණින් මහනුවර සානුව පිහිටා ඇත. ( )

13) අධික වර්ෂාපතනය නිසා නිතර ජල ගැලීම් හා නාය යාම්වලට ලක්වීම හේතුවෙන් තෙත් කලාපයේ භූ දර්ශනය නිරතුරුව වෙනස් වේ. ( )

14) කොළඹ මහනුවර මාර්ගයේ ''බලන කපොල්ල'' පිහිටා තිබේ. ( )

15) කටුනායක, කොග්ගල, බියගම යනු ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධන කලාප 03 කි. ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16) පොළොන්නරුව ........................................................... කලාපයට අයත් නගරයකි.

17) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ ............................................. සමුද්‍ර සන්ධියෙනි.

18) හිරිගල් කැඩීම, වෙරළින් වැලි ඉවත් කිරීම ආදි මානුෂීය ක්‍රියාකාරකම් නිසා ........................................... ඛාධකය වේගවත් වේ.

19) ශ්‍රී ලංකාවට අයත් රාෂ්ට්‍රීය මුහුදු සීමාව වන්නේ නාවික සැතපුම් ............................................. කි.

20) පටු මෝය නිසා කරදිය ගලා එන නොගැඹුරු වෙරළබඩ ලක්ෂණය ........................................ නම් වේ.

(ල. 2x20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5 කි.**



1) ශ්‍රී ලංකාවේ භූ දර්ශනය පිළිබඳ ඔබ ඉගෙන ගත් පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. ඉහත සඳහන් ඡායාරූපය දැකිය හැකි වන්නේ කුමන භූ දර්ශනය තුළ ද? (ල. 02)

   ii. මෙම භූ දර්ශනයට අදාළ වෙනත් භූ ලක්ෂණ 02 ක් නම් කරන්න. (ල. 04)

   iii. මානුෂීය ක්‍රියාකාරකම් නිසා මෙම භූ දර්ශනයට හානි වී ඇති අවස්ථා සඳහා උදාහරණ 03 ක් සඳහන් කරන්න. (ල. 03)

   iv. මෙම භූ දර්ශනයට අදාළ සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථාන 03 ක් නම් කරන්න. (ල. 03)

2)

i. පහත පෘථිවි ආදර්ශ ගෝලයේ ඉංග්‍රීසි අක්ෂරවලින් දක්වා ඇති මනඃකල්පිත රේඛා නම් කරන්න.




(ල. 03)

ii. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

iii. පෘථිවිය පූර්ණ ගෝලයක් නොවන බවට ඉදිරිපත් කළ හැකි සාක්ෂි 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

3)

i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ල. 03)

ii.

a. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම 03 නම් කරන්න.

b. ඉහත ක්‍රම අතරින් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර හා ඊසාන දිග ප්‍රදේශවලට වැසි ලැබෙන ක්‍රමය නම් කරන්න. (ල. 04)

iii. ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් ආරක්ෂා කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 05)

4)

i. කඳුකර දර්ශනයට අයත් ප්‍රධාන නගර 03 ක් නම් කරන්න. (ල. 03)

ii. මධ්‍යම කඳුකරයේ දක්නට ලැබෙන කඳු පන්ති 04 ක් නම් කරන්න. (ල. 04)

iii. කඳුකර භූ දර්ශනය තුළ සංචාරක ආකර්ශනය දිනා ගැනීමට බලපා ඇති හේතු 02 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

5)

i. තෙත් කලාපයේ පිහිටි කාර්මික ජනපද තුනක් නම් කරන්න. (ල. 03)

ii. තෙත් කලාපය තුළ ඔබ හඳුනාගත් නාගරික කාර්මික හා සේවා මධ්‍යස්ථාන ලෙස වැදගත් වන නගර 4 ක් නම් කරන්න. (ල. 04)

iii. තෙත් කලාපයේ මානුෂ ක්‍රියාකාරකම් හේතු කොටගෙන පරිසරයට හානිකර වූ අවස්ථා 03 ක් නම් කර ඒ නිසා මතුවන ගැටලු කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

6)




i. ඉහත සිතියමේ ඉංග්‍රීසි අක්ෂරවලින් නම් කර ඇති දකුණු ආසියාතික රටවල් නම් කරන්න. (ල. 03)

ii. දකුණු ආසියාතික රටවල සමාජ සංවර්ධනය මැනීමට යොදා ගත හැකි සමාජ ආර්ථික දත්ත 4 ක් නම් කරන්න. (ල. 04)

iii. ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් වුව ද, සමාජීය සංවර්ධනය අතින් ඉහළ මට්ටමක් හිමිකර ගත් රටකි. ඒ සඳහා බලපා ඇති සාධක 2 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

7)

i. මහද්වීපයක් යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 03)

ii. ඔබ ඉගෙනගත් මහද්වීප 4 ක් නම් කරන්න. (ල. 04)

iii. පහත දක්වා ඇති ලෝක සිතියමේ A, B, C, D, E අක්ෂරවලින් දැක්වෙන සාගර හා මුහුදු නම් කරන්න.

